01156

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයනවේදී (ගෞරව) උපාධි වැඩසටහන 2022/23
3 වන මට්ටම
**HRU3506 - මානව සම්පත් කළමනාකරණය**
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය : අගෝස්තු 2023
කාලය - පැය දෙක (02) යි.

---

දිනය - 2023.08.19　　　　　වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30

---

උපදෙස් :
සියලුම ප්‍රශ්න වලට සමාන ලකුණු ලැබේ. ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

<u>ප්‍රශ්න අංක 01</u>

(i) මානව සම්පත් කළමනාකරණය සහ උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය අතර වෙනස පහදන්න. (ලකුණු 10)

(ii) මානව සම්පත් කළමනාකරුගේ විවිධ භූමිකාවන් තුනක් (03) හඳුනාගෙන උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)

(ලකුණු 25)

<u>ප්‍රශ්න අංක 02</u>

(i) කාර්මික විප්ලවයේ වර්ධනයට බලපෑ කරුණු හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 10)

(ii) කම්හල් ක්‍රමයේ (Factory System) සේවකයන්ට අහිතකර වූ අඩුපාඩු තුනක් (03) හඳුනාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 15)

(ලකුණු 25)

<u>ප්‍රශ්න අංක 03</u>

(i) කාර්ය සාධන ඇගයීම සහ සංවේතන (වැටුප් හා වේතන) සමාලෝචනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "සංවේතන සමාලෝචනය, කාර්ය සාධන ඇගයීමට සෘජුව සම්බන්ධ කළ යුතු ය."

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ ද? අවම වශයෙන් කරුණු තුනක් (03) ඉදිරිපත් කරමින් ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 15)

(ලකුණු 25)

**ප්‍රශ්න අංක 04**

(i) උදාහරණ භාවිත කරමින් පුහුණු හා සංවර්ධන ක්‍රම දෙක (02) විස්තර කරන්න. (ලකුණු 10)

(ii) "කළමනාකරණ සංවර්ධනය සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද වැඩසටහන් අවශ්‍ය වේ. "

කළමනාකරුවන් සංවර්ධනය කිරීමේ දී භාවිත කරන විශේෂ පුහුණු සහ සංවර්ධන ක්‍රම තුනක් (03) පෙන්නුම් කරමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 15)

(ලකුණු 25)

**ප්‍රශ්න අංක 05**

පහත සඳහන් කරුණු සඳහා කෙටි සටහන් ලියන්න.

(i) පුහුණු අවශ්‍යතා ඇගයීම. (Training Needs Analysis)
(ii) අරමුණුගත කළමනාකරණ ප්‍රවේශය (Management By Objectives - MBO)
(iii) රැකියා භ්‍රමණය (Job Rotation)
(iv) රැකියා ස්ථානයේ ඉගෙනීම (Workplace Learning)
(v) සේවක අනුහුරු කිරීම (Employee Orientation)

(ලකුණු 05 x 05 = 25)

සියලු හිමිකම් ඇවිරිණි.